සැ. යු. - 2014.01.31 දින පළ වූ අංක 1,848 දරන ගැසට් පත්‍රයේ I : III, III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,849 - 2014 පෙබරවාරි මස 07 වැනි සිකුරාදා - 2014.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 208 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 208 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 210 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 215 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 පෙබරවාරි මස 28 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 පෙබරවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිළ ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2014***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිළ ගණන් 2014 පෙබරවාරි මස 25 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250 ක (රුපියල් දෙසිය පනහක) මුදලක් ගෙවා 2014 පෙබරවාරි මස 24 වැනි දින මධ්‍යාහ්න 12.00 තෙක් ලබාගත හැක.

*උපලේඛනය*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිළ ගණන් භාරගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | කොළඹ | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, කොළඹ | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, කිරුල පාර, කොළඹ 05 | නුගේගොඩ | 2014 මාර්තු 1 |

කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිළ ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තරය ද සහිතව 2014 පෙබරවාරි මස 25 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2014 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

02-176

---

# බඩු බාහිරාදිය විකිණීම්

**කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ කාර්යාල භාවිතයෙන් හා ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද, හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ නඩු භාණ්ඩ කාර්යාල භාවිතයෙන් හා ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ 2014.02.22 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ගිහාන් පිලපිටිය,
ප්‍රධාන මහෙස්ත්‍රාත්.

2014 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අංක රහිත | ඇලුමිනියම් සින්ක් | 01 |
| 02. | අංක රහිත | වතුර මෝටර් | 01 |
| 03. | අංක රහිත | කුඩා වතුර මෝටර් | 01 |
| 04. | අංක රහිත | ඇග්‍රොටෙක් වර්ගයේ වතුර මෝටර් | 01 |
| 05. | අංක රහිත | ශීතකරණයක කොටස් | 05 |
| 06. | අංක රහිත | කලුපාට වයර් රෝල් | 02 |
| 07. | අංක රහිත | අර්ත් වයර් රෝල් | 02 |
| 08. | අංක රහිත | කලුපාට වයර් රෝල් | 01 |
| 09. | අංක රහිත | සාස් පාන් | 03 |
| 10. | අංක රහිත | රෙගියුලේටරය සහිත විවෘත ගෑස් ලිප් | 01 |
| 11. | අංක රහිත | ගෑස් සිලින්ඩර් | 01 |
| 12. | අංක රහිත | ගෑස් සිලින්ඩර් | 01 |
| 13. | අංක රහිත | ගෑස් සිලින්ඩර් | 01 |
| 14. | අංක රහිත | ඔක්සිජන් සිලින්ඩර් | 01 |
| 15. | අංක රහිත | කුඩා ගෑස් සිලින්ඩර් | 01 |
| 16. | අංක රහිත | අබලන් කාර් කැසට් | 04 |
| 17. | අංක රහිත | කුඩා අබලන් රේඩියෝ | 01 |
| 18. | අංක රහිත | කොළ පාට ඩ්‍රිල් | 01 |
| 19. | අංක රහිත | තැඹිලි පාට වතුර මෝටර් | 01 |
| 20. | අංක රහිත | අබලන් බ්ලෙන්ඩර් කොටස් | 04 |
| 21. | අංක රහිත | බැටරි චාජර් | 01 |
| 22. | අංක රහිත | අබලන් විදුලි ස්ත්‍රික් | 04 |
| 23. | අංක රහිත | ට්‍රොලි රෝද | 04 |
| 24. | අංක රහිත | තැඹිලි පාට ගිණි නිවන සිලින්ඩර් | 01 |
| 25. | අංක රහිත | ගලි කවර | 05 |
| 26. | අංක රහිත | සිවිලින් ෆෑන් මෝටර් | 02 |
| 27. | අංක රහිත | ටෙන්ට් රෙදි රෝල් | 01 |
| 28. | අංක රහිත | බීටර කොටස් | 01 |
| 29. | අංක රහිත | මල්ටිබොන් ගම් ලොකු ටින් | 02 |
| 30. | අංක රහිත | මල්ටිබොන් ගම් පොඩි ටින් | 28 |
| 31. | අංක රහිත | සවල් | 02 |
| 32. | අංක රහිත | යකඩ අලවංගු | 01 |
| 33. | අංක රහිත | අබලන් ත්‍රී රෝද රථ ටයර් | 06 |
| 34. | අංක රහිත | අබලන් ගෑස් ලිප් | 01 |
| 35. | අංක රහිත | අබලන් බොයිලේරු | 01 |
| 36. | අංක රහිත | සිවිලින් ෆෑන් පෙති | 01 |
| 37. | අංක රහිත | අබලන් හෝන් | 02 |
| 38. | අංක රහිත | අඩි 6 x 3 ප්‍රමාණයේ ප්ලාස්ටික් දොරවල් | 02 |
| 39. | අංක රහිත | යකඩ වීල් | 01 |
| 40. | අංක රහිත | අබලන් සිවිලින් ෆෑන් මෝටර් | 01 |
| 41. | අංක රහිත | ෂාප් වර්ගයේ අබලන් රේඩියෝ | 01 |
| 42. | අංක රහිත | හරස් කියත් | 01 |
| 43. | අංක රහිත | අබලන් රේඩියෝ | 01 |
| 44. | අංක රහිත | ඇලුමිනියම් භාජන | 05 |
| 45. | අංක රහිත | ගිනි නිවන උපකරණ | 01 |
| 46. | අංක රහිත | කුඩා හෝන් | 05 |
| 47. | අංක රහිත | යකඩ අලවංගු | 01 |
| 48. | අංක රහිත | අබලන් මේස ෆෑන් කොටස් | 01 |
| 49. | අංක රහිත | ගිණි නිවන හෝස් | 01 |
| 50. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ තීන්ත ටින් | 19 |
| 51. | අංක රහිත | කොළ පාට සිලින්ඩර | 01 |
| 52. | අංක රහිත | කිලෝ 05 ක් පමණ බර යකඩ රෝද | 05 |
| 53. | අංක රහිත | ෆ්ලෑෂ් ලයිට් | 01 |
| 54. | අංක රහිත | ජනෙල් ග්‍රිල් | 02 |
| 55. | අංක රහිත | අත් කියත් | 02 |
| 56. | අංක රහිත | තණකොළ කපන මැෂිමක එන්ජින් | 01 |
| 57. | අංක රහිත | එල් අයර්න් වලින් සාදන ලද රාමු | 02 |
| 58. | අංක රහිත | අබලන් රේඩියෝ | 02 |
| 59. | අංක රහිත | අබලන් බ්ලෙන්ඩර් | 01 |
| 60. | අංක රහිත | අබලන් විදුලි ස්ත්‍රික් | 02 |
| 61. | අංක රහිත | යකඩ පනිට්ටු | 02 |
| 62. | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 63. | අංක රහිත | වැලි පනිට්ටු | 12 |
| 64. | අංක රහිත | අබලන් ගෑස් ලිප් | 02 |
| 65. | අංක රහිත | අබලන් මේස ෆෑන් | 02 |
| 66. | අංක රහිත | නිල් පාට වතුර මෝටර් | 01 |
| 67. | අංක රහිත | කොටු දැල් | 01 |
| 68. | අංක රහිත | ඇලුමිනියම් ප්ලේට් | 02 |
| 69. | අංක රහිත | ගිනි නිවන සිලින්ඩර් | 01 |
| 70. | අංක රහිත | රිම් එක සහිත යතුරු පැදි ටයර් | 01 |
| 71. | අංක රහිත | කුඩා හෝන් | 04 |
| 72. | අංක රහිත | කුඩා ඇම්ප් | 04 |
| 73. | අංක රහිත | පරණ සිවිලින් ෆෑන් මෝටර් | 01 |
| 74. | අංක රහිත | අබලන් තණකොළ කපන මැෂින් | 01 |
| 75. | අංක රහිත | සවල් | 03 |
| 76. | අංක රහිත | ත්‍රීරෝද රථ ටයර් | 01 |
| 77. | අංක රහිත | අබල්න වතුර පෝච්චි | 01 |
| 78. | අංක රහිත | ලොකු ජැක් | 02 |
| 79. | අංක රහිත | කුඩා ජැක් | 04 |
| 80. | අංක රහිත | අඩි 05ක් පමණ දිග කම්බි කූරු | 04 |
| 81. | අංක රහිත | ගලි කවර | 02 |
| 82. | අංක රහිත | සිවිලින් ෆෑන් මෝටර් | 02 |
| 83. | අංක රහිත | යකඩ ලිප් | 02 |
| 84. | අංක රහිත | තාච්චි | 01 |
| 85. | අංක රහිත | ප්‍රෙෂර් කුකර් කොටස් | 01 |
| 86. | අංක රහිත | ඇලුමිනියම් සින්ක් | 03 |
| 87. | අංක රහිත | ඇලුමිනියම් රාමු | 01 |
| 88. | අංක රහිත | අබලන් මේස ෆෑන් | 01 |
| 89. | අංක රහිත | ගෑස් ලිප් | 01 |
| 90. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 91. | අංක රහිත | යකඩ ඇක්ෂල් | 01 |
| 92. | අංක රහිත | ඇලුමිනියම් ෂීට් රෝල් | 01 |
| 93. | අංක රහිත | සිවිලින් ෆෑන් පෙති | 08 |
| 94. | අංක රහිත | යකඩ අලවංගු | 02 |
| 95. | අංක රහිත | ලොකු බල්බ් | 02 |
| 96. | අංක රහිත | කාන්තා අත් බෑග් | 22 |
| 97. | අංක රහිත | රේසිං බයිසිකල් රෝද | 02 |
| 98. | අංක රහිත | යකඩ අඩ | 10 |
| 99. | අංක රහිත | රිම් කප් | 07 |
| 100. | අංක රහිත | ඇලුමිනියම්, තහඩු | 06 |
| 101. | අංක රහිත | දඬු අඩු | 01 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| | | **කාර්යාල භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ** | |
| 102. | | අබලන් ඇඳි සහිත පුටු | 15 |
| 103. | | අබලන් ඇඳි රහිත පුටු | 02 |
| 104. | | අබන් ඇඳි සහිත බංකු | 02 |
| 105. | | අබලන් වානේ අල්මාරි | 01 |
| 106. | | ලාච්චු සහිත කබඩ් | 04 |
| 107. | | අබලන් යකඩ පෙට්ටි | 03 |
| | | **ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ගලවා ඉවත් කරන ලද භාණ්ඩ** | |
| 108. | | අබලන් වානේ රාක්ක | 01 |
| 109. | | අඩි 2 x 4 ප්‍රමාණයේ පරාල ලී | 40 |
| 110. | | ත්‍රිකෝණ හැඩති ලී කොටස් | 03 |
| 111. | | විවිධ ප්‍රමාණයේ ලී කැබලි තොගය | - |
| 112. | | අඩි 5 x 2 පමණ යකඩ කුරු සහිත ලී ජනෙල් | 04 |
| 113. | | අඩි 15ක් පමණ දිග බාල්ක | 06 |
| 114. | | අඩි 10ක් පමණ දිග දිරාගිය වඩිංගු ලී | 08 |
| 115. | | යකඩ කුරු සහිත අබලන් ලී රාමු | 02 |
| 116. | | අඩි 6 x 3 1/2 ක් පමණ යකඩ දොරවල් | 02 |
| 117. | | විවිධ ප්‍රමාණයේ ෂීට් කැබලි | 30 |
| 118. | | අඩි 5 1/2 x 7 ප්‍රමාණයේ ආච් හැඩැති ලී දොරවල් | 01 |
| 119. | | අඩි 6 x 2 ප්‍රමාණයේ ලී දොරවල් | 01 |
| 120. | | අඩි 6 x 2 ප්‍රමාණයේ ෆ්ලයිවුඩ් දොරවල් | 01 |
| 121. | | අඩි 5 x 4 ප්‍රමාණයේ වීදුරු සහිත ජනෙල් පියන සහිත උළුවහු | 01 |
| 122. | | අඩි 4 x 3 ප්‍රමාණයේ වීදුරු සහිත ජනෙල් පියන් සහිත උළුවහු | 01 |
| 123. | | අඩි 6 x 3 ප්‍රමාණයේ අබලන් උළුවහු | 01 |
| 124. | | අඩි 12ක් පමණ දිග යකඩ කුරු සහිත ලී ජනෙල් | 02 |
| 125. | | අඩි 10ක් පමණ දිග තුන්කාල කම්බි කුරු | 02 |
| 126. | | ටකරන් කැබලි | 03 |
| 127. | | පොසිලේන් උකුකට පෝච්චි | 01 |
| 128. | | අඩි 6 x 1 1/2 ප්‍රමාණයේ ලී දොරවල් | 01 |
| 129. | | අඩි 6 x 2 ප්‍රමාණයේ ලී රාමු | 02 |
| 130. | | එක්ස්සෝස් ෆෑන් | 01 |
| 131. | | ත්‍රී ගැන්ග් ස්විච් | 02 |
| 132. | | ෆයිව් ගැන්ග් ස්විච් | 01 |
| 133. | | ඇම්පියර් 15 ස්විච් සොකට් | 04 |
| 134. | | ඇම්පියර් 5 ස්විච් සොකට් | 02 |
| 135. | | අඩි 200ක් පමණ දිග 1.044 වයර් කැබලි තොගය | - |
| 136. | | සිවිලින් රෝස් | 04 |
| 137. | | හයි ලෙවල් සිස්ටන් | 02 |
| 138. | | පොසිලේන් සින්ක් හා එහි රඳවන | 01 |

02-221

---

# රජයේ නොවන දැන්වීම්

**සීමිත වගකීම් සහිත සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධන අවකරණය පිළිබඳ මහජන දැන්වීම**

2007 වසරේ අංක 7 දරන සමාගම් පනතේ 59 (2) දරන වගන්තියේ නියමයන්ට අනුකූලව මෙම නිවේදනය නිකුත් කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත LOLC ලෙෂර්
සමාගම් අංකය : පී. බී. 3805
ප්‍රකාශිත ප්‍රාග්ධනය : : රු. 3,953,550,000
අවකරණයෙන් පසු ප්‍රකාශිත ප්‍රාග්ධනය : රු. 2,503,550,000

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

LOLC ලෙෂර් සමාගම,
100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.
2014 ජනවාරි මස 16 වැනි දින.

02-07

---

**නිවේදනයයි**

ඇඩ් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**(පෙර එක්ස්ප්ලෝ ලීඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්**

*සමාගමේ ලියාපදිංචි අංකය පීවී 76293*

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුකූලව පහත සඳහන් නම මෙසේ වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුකූලව 2013 දෙසැම්බර් මස 31 වැනි දින සිට එක්ස්ප්ලෝ ලීඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෙර නාමය) එහි නාමය ඇඩ් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (නව නාමය) යනුවෙන් වෙනස් කොට ඇති බවත්, එනමුත් සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය තවදුරටත් අංක 840, මීගමුව පාර, කීරන්ගපොකුණ මාබෝල, වත්තල බවත් මෙයින් අප මහජනතාවට දැනුම් දෙමු.

එස්. පී. සිංහසිරිවීර,
සමාගමේ ලේකම්.

ඇඩ් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 840, මීගමුව පාර,
කීරන්ගපොකුණ, මාබෝල,
වත්තල.

02-06

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : හැරල්ඩ් සිටි කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 96032
ලියාපදිංචි දිනය : 2013.12.12
ලියාපදිංචි ලිපිනය : අංක 114, නුවර පාර, මහර, කඩවත.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල,
දෙහිවල.

02-24

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

ලියාපදිංචි දිනය : 2013 නොවැම්බර් මස 29 වැනි දින
සමාගමේ නම : සූම් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 95816
ලියාපදිංචි ලිපිනය : අංක 1166/එච්, උද්‍යාන පාර, කටුකුරුන්ද, පන්නිපිටිය

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

02-27

---

## සීමිත වගකීම් සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමෙහි නාමය 2013 දෙසැම්බර් මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙහි පෙර තිබූ නාමය : ක්ලැරිජ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී. වී. 75564
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08
සමාගමේ නව නාමය : ක්ලැරිජ් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්වරු.

02-47

---

## ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 4, වජිර පාර, අංක 70 හි සහ දැනට කොළඹ 6, කිරුලපන, බලහේන්මුල්ල පටුමග, අංක 8 හි පදිංචි හුසෙයින් ෂයික් අමීර්උඩින් වන මම, කොළඹ 4, වජිර පාර, අංක 70 හි සහ දැනට එකී ජනරජයේ කිරුලපන සීබල් ඇවනිව්, අංක 18/1 හි පදිංචි මන්සූර් ෂයික් අමීර්උඩින් වෙත ප්‍රදානය කරනු ලැබූ, කේ. නීලකන්ඩන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1984 නොවැම්බර් මස 30 දිනැති අංක 457 දරන ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී මන්සූර් ෂයික් අමීර්උඩින් විසින් අප උදෙසා සහ වෙනුවෙන් කරනු ලැබිය හැකි යම් දෙයක් ගැන අපි වගකීම නොදරනවා ඇත.

හුසෙයින් ෂයික් අමීර්උඩින්.

2014 ක් වූ ජනවාරි මස 06 වැනි දින දී ය.

02-52

---

## ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 4, වජිර පාර, අංක 70 හි සහ දැනට කොළඹ 6, කිරුලපන, බලහේන්මුල්ල පටුමග, අංක 8 හි පදිංචි හුසෙයින් ෂයික් අමීර්උඩින් වන මම, කොළඹ 4, වජිර පාර, අංක 70 හි පදිංචි කොහොෂිමා ෂයික් අමීර්උඩින් වෙත ප්‍රදානය කරනු ලැබූ, කේ. නීලකන්ඩන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1984 නොවැම්බර් මස 30 දිනැති අංක 456 දරන ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කොහොෂිමා ෂයික් අමීර්උඩින් විසින් අප උදෙසා සහ වෙනුවෙන් කරනු ලැබිය හැකි යම් දෙයක් ගැන අපි වගකීම නොදරනවා ඇත.

හුසෙයින් ෂයික් අමීර්උඩින්.

2014 ක් වූ ජනවාරි මස 06 වැනි දින දී ය.

02-53

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වන වගන්තිය ප්‍රකාර පුද්ගලික සමාගමක් වශයෙන් පහත සඳහන් සමාගම 2011 ජූලි මස 08 වැනි දින සංස්ථාගත කළ බවට මෙයින් දන්වමු.

සමාගම් නම : පැනිල්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම අංකය : පී වී 79932
ලිපිනය : අංක 453, දංගල්ල, පැපිලියවල, පූගොඩ
දුරකථන අංකය : 033-2268100.

අධ්‍යක්ෂ මණ්ඩලය.

02-57

## දැන්වීමයි

කොළඹ 05, ස්කෙල්ටන් පාර, අංක 12ඒ හි පදිංචි සිටි දැනට ඇමරිකාවේ පදිංචි ක්ලේමන්ට් හිරන්ත පිලිප් මෙන්ඩිස් (ජා. හැ. අ. 701931840 V) යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. ගන්කන්ද වර්ෂ 2011 ජුනි මස 08 වැනි දින ලියා සහතික කළ අංක 291 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් දෙහිවල, කව්ඩාන අංක 28 හි පදිංචි සෙල්ලප්පෙරුමගේ දුලන්සිතා ප්‍රනාන්දු (ජා. හැ. අං. 817260497 V) වන මා ඇටර්නි බලකාරිය ලෙස පත්කර ඇති අතර එකී ඇටර්නි බලකාරිය වන මා ඉහත කී අංක 291 දරන ඇටර්නි බලපත්‍රය අද දින පටන් අවලංගු කරන බවටත් ශූන්‍ය කරන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම පුරවැසියන් වෙත මා මෙයින් දැනුම් දී සිටින අතර, එකී ඇටර්නි බලපත්‍රය මගින් කවරෙකු හෝ කරනු ලබන කවර ක්‍රියාවකට හෝ මා වගකියනු නොලබන බවත්, එකී ක්‍රියාවන් බලරහිත ශූන්‍ය ක්‍රියාවන් බවත් මා මෙයින් දන්වා සිටිමි.

02-69

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඕල්එබවුට් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් කන්සල්ටන් පීවීටී එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 74520
ලියාපදිංචි ලිපිනය : අංක 614 4/2, මරදාන පාර, කොළඹ 10.

කළමනාකරු.

02-70

---

## සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ග්‍රෑෆෝන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 95593
සංස්ථාගත කිරීමේ දිනය : 2013 නොවැම්බර් මස 15 වැනි දින,
ලියාපදිංචි කාර්යාලය : අංක 71/ඒ, ඇඹිල්ලවත්ත පාර, බොරලැස්ගමුව.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 03.

02-155/1

---

## සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ජීටීසී ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී වී 96209,
සංස්ථාගත කිරීමේ දිනය : 2013 දෙසැම්බර් 24 වැනි දින,
ලියාපදිංචි කාර්යාලය : අංක 805/4ඒ, බංගලාවත්ත පාර, මාබෝල, වත්තල.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 03.

02-155/2

---

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමේ නම 2013 නොවැම්බර් මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කරන ලද බව (8 වැනි වගන්තියට අනුගාමීව) 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුගාමීව මෙයින් ප්‍රසිද්ධ නිවේදනය කරනු ලැබේ.

කලින් තිබූ නම : ලංකා කන්සල්ට් හොල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 10615
ලිපිනය : ලෙවල් 33, බටහිර කුළුන, එචිලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01
නව නාමය : සුප්‍රීම් ග්ලෝබල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

02-155/3

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : කොලිටි සර්ටිෆිකේෂන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 96433
ලියාපදිංචි කළ දිනය : 2014.01.08
කාර්යාල ලිපිනය : අංක 20/7, ශ්‍රී බෝධිරුක්කාරාම පාර, කොළඹ 06.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

02-154

**විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පිළියන්දල, බෝකුන්දර, නිවන්තිඩිය, ස්වශක්ති පෙදෙස, අංක 185/7ඒ හි පදිංචි සුමිත්‍රා ආරච්චිගේ දෝන සෝමාවතී (ජා. හැ. ප. 315820464 V) වන මම එම ලිපිනයෙහි ම පදිංචි ජා. හැ. ප. 771450547 V දරන වීරප්පෙරුම ආරච්චිගේ රංග අලෝල ද සිල්වා යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් චාන්දනී සෙනවිරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.11.18 හා අංක 210 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2014.01.08 වැනි දින සිට බලපවත්වන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව වීරප්පෙරුම ආරච්චිගේ රංග අලෝල ද සිල්වා යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් මින් ඉදිරියට කරනු ලබන කිසිම කටයුත්තක් සම්බන්ධයෙන් මා වගකීමක් බාර නොගන්නා බව ද මෙයින් දන්වා සිටිමි.

සුමිත්‍රා ආරච්චිගේ දෝන සෝමාවතී.

2014 ජනවාරි මස 08 වැනි දින දී ය.

02-152

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගම් නම : ඉස්ටියාගෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 91096
සංස්ථාගත කළ දිනය : 2013 පෙබරවාරි මස 18
ලියාපදිංචි ලිපිනය : අංක 231 බී, දෙමටගහමුලතැන්න, අකුරණ.

එම්. එන්. එෆ්. රියාසා,
ලේකම්.

02-151

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ලියාපදිංචි සමාගමේ නම : ඇබකස් සිලෝන් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96277
ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 237, රණවිරු හෙළසිරි මාවත, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

එස්. ඒ. සී. බී. ගුණරත්න,
සමාගම් ලේකම්.

02-123/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ලියාපදිංචි සමාගමේ නම : ඇක්ටන් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96279
ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 237, රණවිරු හෙළසිරි මාවත, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

එස්. ඒ. සී. බී. ගුණරත්න,
සමාගම් ලේකම්.

02-123/2

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ලියාපදිංචි සමාගමේ නම : එයරොෆෝම් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96281
ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 237, රණවිරු හෙළසිරි මාවත, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

එස්. ඒ. සී. බී. ගුණරත්න,
සමාගම් ලේකම්.

02-123/3

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ලියාපදිංචි සමාගමේ නම : එයා(ර්) පැක් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96280
ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 237, රණවිරු හෙළසිරි මාවත, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

එස්. ඒ. සී. බී. ගුණරත්න,
සමාගම් ලේකම්.

02-123/4

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

ලියාපදිංචි සමාගමේ නම : ප්‍රයිම් එයා(ර්) (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96278
ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 30 වැනි දින
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 237, රණවිරු හෙළසිරි මාවත, බොරගොඩවත්ත, මිනුවන්ගොඩ.

එස්. ඒ. සී. බී. ගුණරත්න,
සමාගම් ලේකම්.

02-123/5

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : ඩ්‍රීම්රොන් බියුටි කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පි වී 3436
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 134 සීබී, හයිලෙවල් පාර, මහරගම
සමාගමේ නව නාමය : ඩ්‍රීම්රොන් කොලේජ් ඔෆ් ආර්ට් ඇන්ඩ් බියුටි (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2014 ජනවාරි මස 13 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-120

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

බෙම්මුල්ල, මුඩගමුව, අංක 42 දරන ස්ථානයේ පදිංචි මුඩගමුවේ මෛත්‍රීමූර්ති හෙවත් ලියන ආරච්චිගේ රංජිත් රෝහණ පෙරේරා වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් පොල්වත්තේ වීරමන්ගේ වික්‍රමරත්න යන අය පත් කරමින් දෙන ලද ජර්මන් සමූහාණ්ඩු ජනරජයේ හැම්බර්ග් හි හැන්සීටික් නගරයේ දී 2003.04.07 වැනි දින දරන බොරිස් ඩී. ග්‍රාල් ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍ර පොතේ 255 කණ්ඩයේ 183 පත් ඉරුවේ 4664 දින පොත් අංකය යටතේ 2003.05.7 දාතම යටතේ ලියාපදිංචිව ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවටත් මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවය.

මුඩගමුවේ මෛත්‍රීමූර්ති හෙවත්,
ලියන ආරච්චිගේ රංජිත් රෝහණ පෙරේරා.

02-136

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන නව සමාගම් පනතේ 09 (01) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : මෙදුසා ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 75858
සංස්ථාගත කළ දිනය : 2010.12.06
ලියාපදිංචි ලිපිනය : අංක 90, මහහුණුපිටිය, මීගමුව
සමාගම් ලේකම් : පොන්නාගේ දිලුම් උදයංග ප්‍රනාන්දු.

02-127

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තියට අනුව පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ගබෝ ඩිවෙලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 95286
සංස්ථාපනය කළ දිනය : 2013 ඔක්තෝබර් 30 වැනි දින

ෂර්ලි ගනේගොඩ ඇසෝසියෙට්ස්,
සමාගම් ලේකම්වරු.

02-193

---

## යෝජිත සමාගම් ඒකාබද්ධ කිරීම පිළිබඳ පොදු නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (3) (බී) වගන්තිය

නෝත් සේල්ස් ත්‍රී ඩී එල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පී වී 6854), නෝත් ක්ලෝත් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පී වී 69889), සහ නෝත් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පී වී 4150) යන සමාගම් ත්‍රිත්වය 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (2) ජේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242 (3) (බී) වැනි ජේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ. මෙම තීරණය සමාගම් තුනෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.01.22 වැනි දින යෝජනා සම්මත කරගන්නා ලදී.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය "නෝත් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්", අංක 74, ජේස් 1, බියගම එක්ස්පෝට් ප්‍රොසෙසින් සෝන්, වල්ගම, මල්වාන ලියාපදිංචි කාර්යාලය වන අතර මෙම ඒකාබද්ධය බලගැන්වෙනු ලබන්නේ 2014 පෙබරවාරි මස 28 වැනිදා විය හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැන්සෙක් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් - පීවී 6
සමාගම් ලේකම්වරු,

අංක 6 ඒ, ඩේසි විලා මාවත,
කොළඹ 04.
2014 ජනවාරි මස 24 වැනි දින,

02-189

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් නාමය : හිදර් ටෙක් (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි කාර්යාලය : අංක 200, කුඹුකුලාව, පොල්පිතිගම
සංස්ථාගත කළ දිනය : 2014 ජනවාරි මස 02 වැනි දින
ලියාපදිංචි අංකය : පීවී 96338

02-218

**අමානා "බැන්ක් පීඑල්සී" (කලින් "අමානා බැන්ක් ලිමිටඩ්" වශයෙන් හඳුන්වන ලද)**

නාමය වෙනස් වීම

අමානා බැන්ක් ලිමිටඩ් සමාගමේ නාමය එකී සමාගමේ කොටස් 2014 ජනවාරි මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලියාපදිංචි කිරීමෙන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (3) වගන්තිය ප්‍රකාරව නීතිය ක්‍රියාත්මක වීම මගින් වෙනස් වී ඇති බව එකී පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ කලින් නම : අමානා බැන්ක් ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 3618
සමාගමේ අලුත් නම : අමානා බැන්ක් පීඑල්සී
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 480, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රීනි එම්. දුනුවිල කෝරළගේ,
සමාගමේ ලේකම්.

අමානා බැන්ක් පීඑල්සී (කලින් අමානා බැන්ක් ලිමිටඩ්).

02-223

---

**2007 අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය**

සමාගමේ නම : ග්ලෝබල් ෂිපිං ලංකා (පීවීටී) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 95467
සංස්ථාගත කළ දිනය : 2013 නොවැම්බර් මස 11 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 85/18, ඉදිවිට, ජාඇල.

ලේකම්.

02-222/1

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - වත්තල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2004.07.30 දිනැති සහ අංක 905 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් ලියා සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2005.06.03 දිනැති සහ අංක 1324 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම ටෙලි මාර්කටිං කන්සියුමර් ඉලෙක්ට්‍රිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට සහ ඇන්ටන් ජූඩ් ජෙයන්ද්‍රන් අරුලන්දම් යන අය උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2014ක් වූ මාර්තු මස 03 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ වත්තල මාබෝල නගර සභා සීමාව තුළ මාබෝලෙහි පිහිටි මීගමුව පාර, වරිපනම් අංක 615 දරන අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් 1992.01.10 වැනි දින මැන සාදන ලද අංක 12631 දරන පිඹුර ප්‍රකා බෙදා වෙන් කරන ලද ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 13.60.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.07.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.09.05 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ මීගමු පාර හරහා මාබෝලේ පාලම පසුකොට යාර 100ක් ගිය තැන දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

02-212

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - මොරටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ කොරළවැල්ලේ පිහිටි වරිපනම් අංක 103 (නව) 73 (පැරණි) කලුහබරලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. පී එල්. ද සිල්වා විසින් 1994 මාර්තු මස 04 වැනි දින සාදන ලද පිඹුරු අංක 33/94 හි ලොට් 1 දරන

පර්චස් නවයයි දශම පහයි දෙකක්
(අ. 0, රූ. 0, පර්. 9.52)

විශාලත්වයෙන් යුත් ඉඩම් ගොඩනැගිලි සහ ගහකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

ලිඳමුලගේ ශානක ද සිල්වා සහ අල්පොන්සුගේ අයෝන් දූෂානි අල්පොන්සු යන අය ණයකරුවන් ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 28 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.10.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.10.29 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2014.02.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.02.07 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට කි. මී. 21 ක් පමණ ගාලු පාරේ ගියවිට මොරටුව පරණ පාලම හමුවේ. එම පාලම ඉදිරිපසින් පිහිටා ඇති කොරලවැල්ල පාරේ කි. මී. 1.2 ක් පමණ ගියවිට ඔබට පෙනෙන මානයේ ඇති යාබද පාරේ ඔබගේ වම්පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) නොතාරිස් ගාස්තුව රු. 2,000,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මොරටුව ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
*නොහොත්* තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල, උසාවි පාර,
කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011 - 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 766, ගාලු පාර, ඉඩම,
මොරටුව.
දුරකථන අංක 011- 2643084-6,
ෆැක්ස් අංකය : 5555523.

02-195

## සෙලාන් බැංකුව පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නුගේගොඩ ලියාපදිංචි කරන ලද සිලිකෝන් ඉන්ෆොමේෂන් සිස්ටම්ස් (පිවීටී) ලිමිටඩ් (කලින් සිලිකෝන් ඩේටා සිස්ටම්ස් (පීවීටී) ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලද) දෙහිවල පදිංචි නරේන්ද්‍ර කුමාර ගංගොඩගේ ගුණතිලක සහ නාවල පදිංචි ලූෂන් ට්‍රෙවින්ස් ගිහාන් වික්‍රමසිංහ යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මිරිහාන, ජනාධිපති මාවත පිහිටි බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා විසින් සාදන ලද 1997.10.22 දිනැති අංක 2732 දරන සැලැස්මේ නිරූපනය වන දැන් වරිපනම් අංක 50 දරන දෙල්ගහකනත්ත නමැති ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහයයි දශම එකක් (අ. 0 රූ. 0 පර්. 10.1) නොහොත් හෙක්ටයාර් 0.025542ක් විශාල ඉඩම.

බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් සාදන ලද අංක 412 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 සහ බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1975.07.31 දිනැති අංක 2747 දරන සැලැස්මේ සඳහන් ලොට් 11, 12, 13 සහ 14 සහ එහි පිහිටි සියලු දේ උඩින් මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපළ 2014 පෙබරවාරි මස 25 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කොළඹ සිට රාජගිරිය දක්වා පැමිණ ශ්‍රී ජයවර්ධනපුර මාවත ඔස්සේ කි. මී. 1ක් ගොස් දකුණු පසට ඇති කෝට්ටේ පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ ගොස් පිටකෝට්ටේ මංසන්ධිය ද පසුකර මිරිහාන දෙසට යන විට ඇති කතෝලික පල්ලිය ද පසුකළ විට වම්පසට ඇති රජමහ විහාර පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 500ක් පමණ ගිය විට වම්පසට ඇති මිහිඳු මාවතට හැරී ගිය විට ජනතා මාවත හමුවේ. ජනතා මාවතේ තවත් මීටර් 100ක් පමණ ගිය විට මාර්ගයේ වම්පසින් වරිපනම් අංක 50 දරන අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ* 2013.07.19 වැනි දින පළ වි ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2013.07.25වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2013.07.25 වැනි දින පළ වී ඇත.

